# ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව- ගල්ඔය දකුණු ඉවුර දමන ව්‍යාපාරය

රැස්වීම පැවති ස්ථානය - නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය,දමන

0 5 MAR 2019

රැස්වීම පැවැත් වු දිනය - 2019.01.29

රැස්වීමේ ප්‍රධානත්වය - නේවාසික ව්‍යාපෘති කළමනාකරු

සහභාගිත්වය

රජයේ නිළධාරි මහතුන්

| අනු අ | නම | තනතුර | ස්ථානය |
|---|---|---|---|
| 01 | එස්.එල්.ඒ.අන්සාර් මහතා | නේවාසික ව්‍යාපෘති කළමනාකරු | දමන |
| 02 | ආර්.ඩී. හරිස්චන්ද්‍ර මහතා | විෂය භාර නිළධාරි කෘ නි.අ කාර්යාලය | අම්පාර |
| 03 | එච්.ඩී.ලක්මාල් මහතා | විෂයානුබද්ධනිළධාරි නි.කෘ.අ.කා. | අම්පාර |
| 04 | එල්.පී.පී.එස්.පුෂ්පකුමාර මහතා | පරිපාලන නිළධාරි | දමන |
| 05 | අයි.එම්.ටී.එම්. බණ්ඩාර මහතා | ඉංජිනේරු සහකාර | දමන |
| 06 | එස්.එම්.අයි. නාරායන මහතා | වගා අධිකාරි | දමන |
| 07 | ජී.පී.මනෝජ් දයාරත්න මහතා | ජනපද නිළධාරි | හිඟුරාණ |
| 08 | පී.ඩී.අයි.රමාලතා | සංවර්ධන සහකාර | එරගම |
| | | | දමන |

ගොවි නියෝජිත මහතුන්

| අනු අං | නම | තනතුර | ස්ථානය |
|---|---|---|---|
| 01 | ඩී.එම්. තිලකරත්න මයා | සභාපති | තිස්ස ගොවි සංවිධානය |
| 02 | කරුණාරත්න ගනේගෙදර මයා | ලේකම් | තිස්ස ගොවි සංවිධානය |
| 03 | යූ. ගුණදාස මයා | සභාපති | මහසෙන් ගොවි සංවිධානය |
| 04 | එම්.පී.විල්සන් මයා | භාණ්ඩාගාරික | මහසෙන් ගොවි සංවිධානය |
| 05 | කේ.ජී.ශාන්ත මයා | භාණ්ඩාගාරික | මුවන්ගල ගොවි සංවිධානය |
| 06 | ඩබ්.එම්.කරුණාදාස මයා | සභාපති | පැරකුම් ගොවි සංවිධානය |
| 07 | ආර්.වයි.එම්.විරසිංහ මයා | සභාපති | ගැමුණු ගොවි සංවිධානය |
| 08 | එම්.ජී.මුණිදාස මයා | සභාපති | මිගහපල්ලම ගොවි සංවිධානය |
| 09 | එම්.ජී.ජයසේන මයා | සභාපති | සේනානායක ගොවි සංවිධානය |
| 10 | ආර්.වයි.එම්.හින්බන්ඩා මයා | ලේකම් | ගැමුණු ගොවි සංවිධානය |
| 11 | යූ.එල්.එම අසිස් මයා | සබාපති | මුදලියාර් ගොවි සංවිධානය |
| 12 | ඒ.එම්.එස්.ඉබ්‍රාහිම් මයා | සභාපති | එරගම ගොවි සංවිධානය |
| 13 | ඒ.එම්.මුතලිප් මයා | නියෝජිත | පෙරුවලිකන්ඩම් ගොවි සංවිධානය |
| 14 | ඒ.එල්.මෛජුන් මයා | ලේකම් | වික්ලාමඩුව ගොවි සංවිධානය |
| 15 | ඒ.ආර්.එම්.අලියාර් මයා | භාණ්ඩාගාරික | මුදලියාර් ගොවි සංවිධානය |
| 16 | ජයරත්න ගෝණපිනුවල මයා | මාධ්‍යවේදී | දමන |
| | | | |

## පිලි ගැනිම හා අරමුණ පැහැදිලි කිරිම - එස් .එල් .ඒ. අන්සාර් නේවාසික ව්‍යාපෘති කළමනාකරු දමන

2019 ජනවාරි මාසයට නියමිත ව්‍යාපාර කමිටු රැස්වීම සාර්ථක කර ගැනිම සඳහා පැමිණි සියලුම රජයේ නිළධාරි මහත්ම මහත්මීන් සහ ගොවි සංවිධාන නියෝජනය කරමින් පැමිනි සියලුම ගොවි නියෝජිත මහත්ම/මහත්මීන්ද මා ගෞරවයෙන් යුතුව පිලිගනු ලබනවා.

අද දින විශේෂයෙන් සාකච්ජා කිරිමට නියමිත කරුණු කිහිපයක් අතරින් සේනා දළඹුවාගේ ව්‍යාප්තිය සම්බන්ධ දැනුවත් කිරිමක්, හොදම ගොවි සංවිධානය තේරිමේ තරග ප්‍රතිපල දැනුම්දිම ආදි කරුණු පවතින අතර මේ වන විට වගාවේ තත්වය හා ජල මුර ලබාදිම සම්බන්දයෙන් ඇති ගැටලු සාකච්ජා කිරිමට නියමිතයි.අප මුලින්ම සේනා දලඹුවාගේ ව්‍යාප්තිය වලක්වා ගැනිම සම්බන්ධව දැනුවත් කිරිමෙ වැඩ සටහන වෙත යොමු වනවා.

ඒ අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරි මහතුන් විසින් සේනා දළඹුවාගේ ඇතිවීම ,ව්‍යප්තිය හා පාලනය කල හැකි ක්‍රම හා මේ වන විට පැතිරී ඇති වගාවන් පිලිබඳ දර්ශන සමගින් පූර්ණ දැනුවත් කිරිමක් සිදු කරන ලදි.

ඊට අමතරව මේ වන විට වී වගාව පීදෙන මට්ටමේ පවතින හෙයින් පවතින දේශගුණික තත්වය කිඩැවාගේ ව්‍යාප්තියට හිතකර තත්වයන් ඇති කරන බැවින් නිරන්තරයෙන් වගාව පිලිබදව පරික්ෂාවෙන් පසුවන ලෙස ඉල්නවා. දැනුවත් කිරිම් හා උපදෙස් ප්‍රෙද්ශය බාරව කටයුතු කරන කෘෂිකර්ම උපදේශ ක මහතාගෙන් ලබා ගන්නා ලෙසද දැනුම් දිමට කැමතියි.

ආයතන සංවර්ධන කටයුතු - එස්. එල්. ඒ. අන්සාර් නේවාසික ව්‍යාපෘති කළමනාකරු දමන

මාස කිහිපයක සිට අප කාර්යාලය මගින් දැනුවත් කිරිමේ කටයුතු සිදු කිරිමෙන් අනතුරුව හොදම ගොවි සංවිධානය තේරිමේ තරගාවලිය විනිශ්චය මණ්ඩඩය විසින් තෝරා මේ වන විට අවසන් කර තිබෙනවා. ඒ අනුව ප්‍රතිඵල පරික්ෂා කිරිම සදහා ගොවි සංවිධාන වෙත ඉදිරිපත් කරන ලදි.

| ඉදිරිපත් කල අය | ගැටලුව | විසඳුම | වගකිම | කාලය |
|---|---|---|---|---|
| වාරිමාර්ග ගැටලු | | | | |
| අයි.එම්.ටී.එම් බණ්ඩාර මහතා වාරි ඉංජි සහකාර | මේ වන විට සේනානායක සමුද්‍රෙය් ජල ධාරිතාවය අක්කර අඩි 283000 ක් වන අතර එය උසින් අඩි 76 ක් පමණ වේ. අක්කරපත්තු ප්‍රෙද්ශයේ මේ වන විට අස්වනු නෙලිම ආරම්භ කර ඇති බැවින් ජලය නිකුත් කිරිම අවසන්.ඉහළ කොටසට තවත් ජල මූරයක් ලබා දෙන අතර ජලය අවශ්‍ය නොවන අවස්ථා වලදි වහාම දැනුම් දෙන ලෙස මතක් කරනවා.<br>සිනි සමාගමේ වගා කාල සටහන ලැබී ඇති අතර එය ව්‍යාපෘර කමිටුවට ඉදිරිපත් කරන ලෙසද දැන්විය. | | | |
| එම්.ජී.ජයසේන මහතා සභාපති සේනානායක ගොවි සංවිධානය | ආර්.බී. 6 බී ඇලට පෝල්බට ලබා ගැනිම | පරින්ෂා කර බලා ලබා දිය හැකි බව දැන්විය | වා මා දෙ | ඉදිරි සතිය තුල |
| ආර්.වයි.එම්. වීරසිංහ මහතා ගැමුණු ගොවි සංවිධානයේ ගරු සභාපති | කැඩී ඇති පැති බැම්ම සදහා තාවකාලිකව පස් පුරවා දෙන ලෙස කල ඉල්ලිම | අවසන් ජල මූරය ගැටලුවකින් තොරව ලබා ගැනිම සදහා පුණරුත්තාපන වැඩ සදහා පස් සපයන අයට එම ස්ථානය වෙත පස්ලබා දෙන ලෙස දැනුවත් කරන බව දැන්විය | වා මා දෙ | ඉදිරි සතිය තුල |
| එම්.ජී.මුණිදාස මහතා සභාපති මිගහපල්ලම ගොවි සංවිධානය | දැල් පාලම අසලට යනතෙක් කෘෂි පාර අබලන් | ටෙලිකොම් ආයතනයේ කණු කිහිපයක් වෙනස් කිරිමට සිදු වී ඇති බැවින් එම පාර සකස් කිරිමේ යම් ප්‍රමාදයක් පවතිනවා. මාර්තු මාසය වන විට එය සිදු කරන බවට දැනුම් දි ඇති අතර | වා මා දෙ | මාර්තු මාසයේ දි |

| | | | | |
|---|---|---|---|---|
| | | එය සකස් කර දිය හැකි බව දැන්විය | | |
| එම්.ජී.ජයසේන මහතා සභාපති සේනානායක ගොවි සංවිධානය | ඇතිණිකඩ කොටසේ ගම්පෙරළිය යටතේ සකස් කල කෘෂිපාර සෝදාපාලුවට ලක් වෙලා | ගොවිජනසේවා දෙපාර්තමේන්තුව මගින් පාලනය වන වැවකට අයිති ප්‍රදේශයක් බැවින් ගොවිජන සංවර්ධන නිළධාරිතුමන්ගේ අවධානය ඒ සහසා යොමු කරන බව දැන්විය | ගොවිජන සංවර්ධන නිළධාරි | |
| යූ. ගුණදාස මහතා සභාපති මහසෙන් ගොවි සංවිධානය | ආර්.බී.7.ඇලේ පුණරුත්තාපන කටයුතු.7ඒ ඇලේ ඇති ගල ඉවත් කර ගැනිම,කෘෂිපාර සකස් කර ගැනිම | ඒ සම්බන්ධයෙන් දැනුවත්ව සිටින බවත් ඉදිරියේ දි එය ඉටු කර දිමටත් එකග විය | වා මා දෙ | |
| කේ. ගනේගෙදර මහතා ලේකම් තිස්ස ගොවි සංවිධානය | ආර්.බී. 5 ඇලේ සංවර්ධන කටයුතු යටතේ පැතිබැමි 02කක් අවශ්‍ය ස්ථාන වලට මාරු කර ගැනිම. | පරික්ෂා කර බලා අවශ්‍ය ස්ථාන වලසකස් කර දිමට එකග විය | වා මා දෙ | |
| යූ.පී.කේ.නන්දනි සේනාධීර මිය-ලේකම් කිණවත්ත ගොවි සංවිධානය | අයාලේ යන ගවයින් සදහා පිලියමක් අවශ්‍යයි.ආර්.බී.12 ඇලේ බන්ට් වෙල්ල පහතින් ඇති නිසා වැඩිපුර ජලය ගෙන යාමට නොහැකිවිම හා ජලය අපතේ යාම | වේල්ල පහතින් ඇතිස්ථාන පරික්ෂා කර බැලිමට තිරණය විය ගවයින් සම්බන්ධ තිරණයක් ගැනිමට වැවිලි සමාගම එකග විය | | |
| ජ්.ජ්.මුතලිප් මයා නියෝජිත පෙරැවලිකණ්ඩම් ගොවි සංවිධානය | පරක්කාඩ් ඇනිකට් එකෙන් ජලය ගන්නා කොටසට 25 වන තෙක් ජලය අවශ්‍යයි. | ආර්.බී.12/13 ඇලවල් වල ජලය එන නිසා ගැටලුවක් ඇතිනොවෙවි. | වා මා දෙ | |
| ඩී.එම්.අබේගුණවර්ධන මහතා කරලැව ගොවි සංවිධානය | ආර්.බී.18.ඇල හැරිමේදි අවහිර කල පුද්ගලයා නිසා ඇල නඩත්තු කිරිම අපහසුයි. | කන්නය අවසන් වූ පසු ඇල ගොඩ දමා ගැනිමට මැෂින් එකක් ලබා දිමට | | |

| | | | | |
|---|---|---|---|---|
| | | දෙන ලෙසද දැන්විය | | |
| නේවාසික ව්‍යාපෘති කළමනාකරු දමන | මේ වන විට වැවේ ජල ප්‍රමාණය අක්කර අඩි 283000 ක් ඇති බව ප්‍රකාශ කලා නමුත් සිනි සමාගම මගින් සම්පූර්න සැලසුම් කල වගාවට බිම් සකස් කරමින් සිටිනවා.එවිට වි වගාව සඳහා පවතින ජලය ප්‍රමානවත් වේ දැයි අපට ගැටලුවක් ඇතිවි ඇති නිසා ගොවින් සමග අප ඒ පිලිබදව විමසිලිමත් වන බැවින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටිනවා. සාකච්ජාවක් වහාම කැදවා ගොවින්ට තොරතුරු ලබා දෙන ලෙස. | සිනි සමාගමේ වගා කාල සටහන ලැබුනේ දැන් තමයි .මේ සම්බන්ධයෙන් අදාල ආයතන සියල්ල එකතු වි සාකච්ජා කර තිරණයක් ගත යුතු බැවින් සමාගම විසින් ඒ සඳහා ඉහළ බලධාරින්ට දැනුම් දි දිනයක් වෙන්කරවා ගෙන අප වෙතද දැනුම් දිමට කටයුතු කරන ලෙස දැන්විය | ගල්ඔය වැව්ලි සමාගම | |
| ගොවිජනසේවා කටයුතු ගොවිජන සංවර්ධන නිළධාරි සුජිත් විජයවික්‍රම මහතා | සේනා දළඹුවාගේ ව්‍යාප්තිය පිලිබදව කෘෂිකර්ම දෙපාර්තාමින්තුවෙන් දැනුවත් කිරිම සිදු කලා. අප අවධානය යොමු කල යුත්තේ මර්ධනය කර ගැනිම සම්බන්දයෙනුයි.හානි සම්බන්ධයෙන් ලේඛණ සකස් කරන ලෙස දැනුම් දිම් සිදු කලේ ඊයේ දිනයේ. අද සිට තක්සේරු කිරිම් සිදු කරනවා.ඒ සඳහා පැමිණෙන කණ්ඩායමට සහය ලබා දෙන්න.බඩ ඉරිගු සම්බන්ද දත්ත පද්ධතියක් අප සතුව නැහැ.ඒ නිසා ගොවි සංවිධාන වල සහය අවශායි නිවැරදි බාවය තහවුරු කර ගැනිමට.දින 03 ක් ඇතුලත වාර්තා ලබා දිය යුතුයි. කිසියම් වන්දි මුදලකක් ලැබේවි.වැදගත් වන්නේ සේනා දළඹුවා මර්ධනය කර ගැනිමයි. | | | |
| | පසු ගිය රැස්විමක දි මිගහපල්ලම ගොවි සංවිධානය යොමු කල ප්‍රශ්නයක් ලෙස පැරනිගම ගබඩාමේ පොහොර බෑමේ කුලිය නොගෙවිම ගැටලුවක් ලෙස ප්‍රකාශ වි තිබුනා. එයට හේතුව එම ගබඩාව මධ්‍යස්ථානයේ ගබඩාවක් ලෙස පිලි නොගැනිමයි. එක් ගොවි සංවිධානයකට පොහොර ගබඩා කිරිම වෙනුවෙන් ගබඩාවක් නඩත්තු කිරිම අපහසු කාර්යක් බැවින් මුදල් ගෙවිම නවතා ඇති අතර, කලින් එය මධ්‍යස්ථානයේ ගබඩාවක් ලෙසගොවි සංවිධාන කිහිපයකම පෙහොර එහි ගබඩා කර බෙදාහැරිම සිදු කල නිසා පොහොර බෑමේ කුලිය ලබා දිමට හැකි විය.ඒ නිසා මිගහපල්ලම අය දමන ගබඩාවෙන්ම පොහොර ලබා ගන්නා ලෙස දැනුම් දෙනවා. | | | |
| එම්.ජි.මුණිදාස මහතා මිගහපල්ලම ගොවි සංවිධානයේ ගරු සභාපති | කලින් මිටියකට රු 6ක් ගෙවු අතර දැන් ගෙවිය නොහැකියි නම් අප ගබඩාව ඉබි යතුරු දමා ආරක්ෂා කිරිමක් නොකර දමන ගබඩාවෙන් පොහොර ලබාගැනිම සිදු කරනවා. | එය සුදුසුම පියවර බව දැන්විය | ගොවිජනසේවා දෙපාර්තමේන්තුව | |
| එම්.ජි.මුණිදාස මහතා මිගහපල්ලම ගොවි සංවිධානයේ ගරු සභාපති | ඇලවෙලි සුද්ද නොකරන අයගේ පොහොර ප්‍රමාද කරන ලෙස දැනුම් දුන්නද කෘ ප නි ස මහතා හරහා ඒවා ලබා ගන්නා නිසා ගොවි සංවිධාන වල නිළධාරින් අපහසුතාවයට පත් වෙනවා. මේ සඳහා විසඳුමක් අවශායයි. | සහනාධාර බලපෑමක් නිසා නතර කල නොහැකියි. නමුත් අප උපක්‍රමශිලිව කටයුතු කල යුතුයි. අක්කරබදු නොගෙවුවහොත් නිති මගින් කටයුතු කල හැකියි. | පොහොර | |

| | | | |
|---|---|---|---|
| | | හැකියි-ගොවිජන සංවර්දන නිළධාරි | |
| නේවාසික ව්‍යාපෘති කළමනාකරු දමන | කන්න රැස්වීම් තීරණ ගනු ලබන්නේ දිස්ත්‍රික් ලේකම්තුමන්ගේ අනුදැනුම ඇතිව. එතුමාට ඒ පිලිබදව තීරණ ගත හැකියි.සියලු ආයතන එම තීන්දු වලට යටත්විය යුතුයි. වහාම කාරක සභාව කැදවන්න මා දැනුවත් කිරිමට පැමිණෙනවා. | | |
| පරිපාලන නිළධාරි දමන | බඩ ඉරිතු වගාවට සම්බන්ධ ගොවින් ලේඛණ ගැනිමට පැමිණෙන පිරිසට සහය ලබා දෙන්න. දමන ප්‍රාදේශිය ලේකම් කොට්ටාශයේ ග්‍රාම නිළධාරි වසම් 04(මොරගහපල්ලම,හිදකලුගම,මුල්ලේග ම,එග්ගල්ඔය) ක කමිටුවක් සකස් කර Facebook ගිණුමක් සකස් කරනවා. පවතින ගැටලු ඒ වෙත යොමු කිරිමෙන් ඒ සදහා විසදුම් ක්ෂනිකව ලබා ගත හැකි යි. මෙය නියමු ව්‍යාපෘතියකි. ඉදිරියේ දි අනෙකුත් වසම් වලද ක්‍රියාත්මක වේවි.තාක්ෂණයෙන්උපරිම ප්‍රයෝජන ගැනිමට ගොවින්ට ද අවස්ථාව ලබා දිම අරමුණයි. | | |
| ඉන්දික නාරායන මහතා -වගා කළමනාකරු ගල්ඔය වැව්ලි සමාගම | සමාගම විසින් හෙක්ටයාර් 4000 ක් වගා කිරිමට සැලසුම් කලා.මේ වන විට බිම් සැකසිම 3800 ක් පමන අවසන්,පෙබරවාරි මාසයේ කෙටි ඇඹරුම් වාරයක් ආරම්භ කිරිමට නියමිතයි.එහිදි උක් ටොන් 20000 ක් පමණ ඇඹරිමට අපේක්ෂිතයි.<br>සේනා දළඹුවාගෙන් උක් වගාව ආරක්ෂා කර ගැනිමට අප විවිධ පියවරයන් මේ වන විට ගෙන තිබේ.සිද්ධින් 17ක් පමණ වාර්තා වු අතර ඒ සියල්ල සහමුලින්ම විනාශ කර දැමුවා.<br>ආර්.බි.12/13 ඇලවල් ප්‍රතිසංස්කරණකටයුතු ආරම්භ කලා. ජලය සම්බන්ධයෙන් ගැටලුවක් මතු කලා. මා ඒ සම්බන්ධව ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය සමග සාකච්ජා කර සාකච්ජාවක් සදහා දිනයක් ලබා දිමට පොරොන්දු වෙනවා | | |
| ජනපද නිළධාරි එරගම | ලියාපදිංචිවි නොමැති අයට බලපත්‍ර ලබා දිමෙට හැකියාවක් නොමැති අතර මුලින්ම කල යුත්තේ ලියාපදිංචි විමයි.<br>රැකියා වල නියුතු හා ඉහළ ආදායම් ඇති තතත.ත.ක.තකතතකතකකතඅයවලුන් සදහා බපලපත්‍ර ගොවි පන්තියෙන් ලබා ගත නොහැකියි. ඒ සදහා යම් තක්සේරු වටිනාකමක් ගෙවිය යුතුයි. එය වාරික 10කින් ගෙවිමේ හැකියාව පවතනවා.<br>ප්‍රකාශන ඔප්පු වලට වටිනාකමක් නැහැ.ඒ නිසා අනිවාර්යයෙන් දිමනාපත්‍රයක් ලබා ගැනිමට කටයුතු කරන්න. | | |
| | | | |

එස්.එල්.ඒ.අන්සාර්,
නේවාසික ව්‍යාපෘති කළමනාකරු,
දමන.